# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2397/68 - 2024 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2024.08.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : KDS/AKU/4/2/1/102.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2020/WS/81.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* :-

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 581 දරන කොනකලගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොනකලගල ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කර අනුමත කරන ලද 2023.10.10 වැනි දිනැති අංක කා.සි. 320668 දරන කැඩැස්තර සිතියමේ, කැබලි අංක 2 සහ 3 වශයෙන් දැක්වෙන කින්නරපැල කුඹුර නැමති ඉඩමෙහි මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0562 ක පමණ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක :

01. **කැබලි අංක 02**
ඉඩමේ නම: කින්නරපැලකුඹුර; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : කේ.පී.ඩී.කේ. ප්‍රියදර්ශණී ද සිල්වා මහත්මිය, අංක 100, ශ්‍රී විජිත මාවත, කොනකලගල, අලවතුගොඩ; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.0370 (පර්චස් 14.6).

*ඉඩමේ මායිම් :*
*උතුරට* : කැබලි අංක 1 සහ ජී.එන්. ප්‍රේමවර්ධන හිමිකම් කියන කින්නරපැලකුඹුර; *නැගෙනහිරට* : ජී.එන්. ප්‍රේමවර්ධන හිමිකම් කියන කින්නරපැලකුඹුර සහ කැබලි අංක 4; *දකුණට* : කැබලි අංක 4, 3 සහ කේ.පී.ඩී.කේ.පී.ඩී. සිල්වා හිමිකම් කියන කින්නරපැලකුඹුර; *බටහිරට* : කේ.පී.ඩී. කේ.ඩී. සිල්වා හිමිකම් කියන කින්නරපැල කුඹුර සහ කැබලි අංක 1.

02. **කැබලි අංක 03**
ඉඩමේ නම: කින්නරපැලකුඹුර; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : කේ.පී.ඩී.කේ. ප්‍රියදර්ශණී ද සිල්වා මහත්මිය, අංක 100, ශ්‍රී විජිත මාවත, කොනකලගල, අලවතුගොඩ; ඉඩම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.0132 (පර්චස් 5.2).

*ඉඩමේ මායිම් :*
*උතුරට* : කේ.පී.ඩී. කේ.පී.ඩී. සිල්වා හිමිකම් කියන කින්නරපැලකුඹුර, කැබලි අංක 2 සහ 4; *නැගෙනහිරට* : කැබලි අංක 2, 4, සහ ඇළ (වියළි); *දකුණට* : කැබලි අංක 4, ඇළ (වියළි) සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); *බටහිරට* : මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ කේ.පී.ඩී. කේ.පී.ඩී. සිල්වා හිමිකම් කියන කින්නරපැල කුඹුර.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ **2024 සැප්තැම්බර් මස 27 වැනි දින පෙ.ව. 10.00** ට අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, **2024 සැප්තැම්බර් මස 18** වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, ඒකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු යි.

**ඩී. ආර්. කේ. හෙන්නායක,**
ප්‍රාදේශීය ලේකම්,
අකුරණ.

2024 අගෝස්තු මස 14 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0201

---

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ශුද්ධි පත්‍රිකාව

*යොමු අංකය* : 3/2/3/10/267.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියට යටත්ව අංක 2016/33 හා 2017.04.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද දැන්වීමේ 13ඒ සහ 14ඒ පිටුවල සඳහන් කැඩැස්තර සිතියම් අංක 510614 හි කලාප අංක 02, පත්‍ර අංක 03 හි කැබලි අංක 500 සහ කැඩැස්තර සිතියම් අංක 510614 හි කලාප අංක 02, පත්‍ර අංක 03 හි කැබලි අංක 515 යන ඉඩම් කොටස්වලට අදාළ ඡේද පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

01. **කැබලි අංක 500**

ඉඩමේ නම: ළිඳමුලකුඹුර; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවුරුදු 40-50 ක් පමණ වයසැති පොල් ගස් 08ක් ද, අවුරුදු 10-20 ක් පමණ වයසැති මහෝගනි ගස් 03 ක් සහ මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : පී. ඒ. පී. කේ. අතුකෝරල, අංක 35, ශ්‍රී ධම්මානන්ද මාවත, පත්තලගෙදර, වේයන්ගොඩ. (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0326.

02. **කැබලි අංක 515**

ඉඩමේ නම: ළිඳමුලකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය : රජය; මුල් හිමිකම් කියන අය : පී. ඒ. පී. කේ. අතුකෝරල, අංක 35, ශ්‍රී ධම්මානන්ද මාවත, පත්තලගෙදර, වේයන්ගොඩ. (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0610.

**එස්. පී. ගුණවර්ධන,**
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල.

2024 අගෝස්තු මස 12 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0202

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.